# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/01/i/පොදු | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2022.06 20 |

ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ : 03/2022(01)

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

<u>රජයේ කාර්යාල වෙත නිලධරයන් කැඳවීම සීමා කිරීම</u>

උක්ත මැයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද අංක EST–6/03/LEA/1060 හා 2022.06.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 15/2022 හා 2022.06.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 16/2022 සම්බන්ධව 2022.06.18 දින, ගරු ආණ්ඩුකාරතුමා ගේ ප්‍රධානත්වයෙන්, පළාත් අමාත්‍යාංශ ලේකම් වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් සමඟ පැවති විශේෂ සාකච්ඡාවෙහිදී ගනු ලැබූ තීරණ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඒ අනුව 2022.06.20 දින සිට 2022.07.01 දින දක්වා සති දෙකක කාලය තුළ කාර්යාල වෙත නිලධරයන් කැඳවීම පහත පරිදි සිදු කළ යුතුය.

1) රජයේ කාර්යයන් බිඳ වැටීමකින් තොරව පවත්වාගෙන යාමට සතියේ වැඩ කරන දින කාර්යාලය ආසන්නයේ ස්ථිර පදිංචි හෝ තාවකාලිකව නවාතැන් ගෙන සිටින නිලධාරීන් ආයතනය සතු සංචිත වාහන උපයෝගී කොටගෙන මනා පිරිවැය කළමනාකරණයකින් යුතුව ප්‍රවාහන පහසුකම් සලසා දෙමින් අවම කාර්යය මණ්ඩලයක් සේවයට කැඳවා ගැනීම දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියාගේ වගකීම වේ.
2) එසේ අවම සේවක සංඛ්‍යාවක් සේවයට කැඳවන අවස්ථාවේ දී වුව ද සේවා මුර ක්‍රමයක් හෝ වෙනත් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය.
3) එසේ සේවයට කැඳවනු නොලබන සියලුම රජයේ නිලධාරීන් මාර්ගගත (Online) ක්‍රමය හෝ නිවසේ සිට රාජකාරි ඉටු කිරීම (Work from home) ක්‍රමය ඔස්සේ ස්වකීය රාජකාරියට අදාල කාර්යයන්හි නිරත කර විය යුතුය.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary - 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office - 091 4119011, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax - 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail - chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site - www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.

பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

4) මෙම කාලසීමාව තුළ ද සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දිනවල කාර්යාල වසා තැබීමට කටයුතු කළ යුතුය.

5) රජයේ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගෙන යාමට මෙයින් බාධාවක් නොවිය යුතු බවද අවධාරණය කරමි.

03. 2022.07.04 දින සිට නැවත දැනුම් දෙන තෙක් රාජ්‍ය නිලධරයන් සේවයට කැඳවීම පහත පරිදි සිදුකළ යුතුය.

1) දැනටමත් නිකුත් කර ඇති දකුණු පළාත් ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 03/2022 පහත සඳහන් සංශෝධනයට යටත්ව එලෙසම ක්‍රියාත්මක කළ යුතුය.

සඳුදා දිනයද ඇතුලුව සතියේ වැඩ කරන දින 5 ම 50% ක හෝ ආයතන ප්‍රධානියාගේ අවශ්‍යතා ප්‍රකාරව නිලධාරීන් සේවයට කැඳවිය යුතුය. කාර්යාලයට සේවයට වාර්තා නොකෙරෙන දිනවල මාර්ගගත (Online) ක්‍රමය හෝ නිවසේ සිට රාජකාරි ඉටු කිරිම (Work from home) ක්‍රමය හා ගෙවතු වගා හෝ කෙටිකාලීන ආහාර බෝග නිෂ්පාදනය සඳහා කටයුතු කිරිම කළ යුතුය.

04 මේ සම්බන්ධයෙන් ඔබට අයත් ආයතනවල ආයතන ප්‍රධානීන් ද දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ආර්. සී. ද සොයිසා,
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත :- ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස